සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
**Department of Education Central Province**

**11 ශ්‍රේණිය** | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | **84 S I**

**ශිල්ප කලා - I** | **කාලය පැය එකයි**

**සැලකිය යුතුයි :-** ● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
● ප්‍රශ්න අංක 1-40 තෙක් දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. රජ මැදුරු අලංකරණයට පන්සල් ආශ්‍රිත ක්‍රියාකාරකම් වලදී මෙන්ම ප්‍රභූන්ගේ පරිහරණය සඳහා ඉතා සියුම්ව නිර්මාණයන් සිදු කෙරෙන ජන කලා ආශ්‍රිත කර්මාන්තයක් වන්නේ,
   1. පිත්තල කර්මාන්තය
   2. ලාක්ෂා කර්මාන්තය
   3. වෙස් මුහුණු කර්මාන්තය
   4. පන් පැදුරු කර්මාන්තය

02. කෝණ වර්ග අතුරින් $90^0$ ට වඩා වැඩි අගයකින් යුතු කෝණ වර්ග වල නම් පමණක් අඩංගු පිළිතුර වන්නේ,
   1. සරල කෝණය, පරාවර්තන කෝණය
   2. සරල කෝණය, සුළු කෝණය
   3. පරාවර්තන කෝණය, ඍජු කෝණය
   4. ඍජු කෝණය , සුළු කෝණය

03. පහත සඳහන් වෘත්තයෙහි අඩක් අඳුරු කිරීම සඳහා භාවිතා කරන ලද සම්මත රේඛා වර්ගය වන්නේ,
   1. ඝන අඛණ්ඩ රේඛා
   2. කඩ රේඛා
   3. සිහින් දාම රේඛා
   4. සිහින් අඛණ්ඩ රේඛා




04. මෙහි දැක්වෙන ජ්‍යාමිතික නිර්මාණයෙන් දැක්වෙන්නේ
   1. D ලක්ෂ්‍යයේ සිට AB රේඛාවට ලම්භකයක් ඇඳීම
   2. AB රේඛාවේ පිහිටි C ලක්ෂ්‍යයට ලම්භකයක් ඇඳීම.
   3. C ලක්ෂ්‍යයේ සිට AB රේඛාවට ස්පර්ශකයක් ඇඳීම.
   4. AB රේඛාවේ ලම්භ සම්වඡේදනය ඇඳීම.

05. පහත දැක්වෙන මෝස්තරය තුළ ඇති ඒක කේන්ද්‍රීය වෘත්ත සංඛ්‍යාව
   1. එකකි 2. තුනකි 3. හතරකි 4. දෙකකි



06. පහත දැක්වෙන චතුරස්‍ර අතුරෙන් පාද දෙකක් පමණක් සමාන්තරවන චතුරස්‍රය වන්නේ,
   1. සමචතුරස්‍රය
   2. චතුරස්‍රය
   3. ත්‍රපීසියම
   4. ඍජුකෝණාස්‍රය

07. පහත දැක්වෙන ඝන වස්තු නිර්මාණය කිරීමේ දී විකසනය ඍජුකෝණාස්‍රාකාර හැඩය ගන්නා ඝන වස්තු යුගලය වන්නේ,




   1. A සහ B 2. A සහ D 3. B සහ D 4. A සහ C

08. වෘත්තයක් තුළ සවිධි ෂඩස්‍රය නිර්මාණය කිරීමේ දී ෂඩස්‍රයේ ශීර්ෂ වෘත්තය මත ලකුණු කර ගැනීම සඳහා අඳිනු ලබන චාපවල අරය වන්නේ දී ඇති වෘත්තයේ
   1. අරයට සමාන දිගකි.
   2. විෂ්කම්භයට සමාන දිගකි
   3. අරය මෙන් තුන් ගුණයකි.
   4. අරය මෙන් හය ගුණයකි.

09. ABCDE යනුවෙන් නම් කළ සවිධි පංචාස්‍රයක A හා C ද A හා D ද යා කළ විට පංචාස්‍රය තුළ ලැබෙන ජ්‍යාමිතික රූප
   1. ත්‍රපීසියම වේ.
   2. සමද්විපාද ත්‍රිකෝණ වේ.
   3. සමපාද ත්‍රිකෝණ වේ.
   4. විෂමපාද ත්‍රිකෝණ වේ.

10. ඉලිප්සයයක නාභිය හරහා නියාමන අක්ෂයට ඇඳෙන ලම්භකයේ වක්‍ර තුළ වූ කොටස හඳුන්වන නාමය වන්නේ,
1. සුළු අක්‍ෂය 2. මහා අක්‍ෂය 3. චාපය 4. ඒක කේන්ද්‍රික වෘත්ත

11. රෙදිපිළි පින්තාරු කිරීමේ දී යොදා ගන්නා වර්ණවල පාරදෘශ්‍ය බව ඇති කරලීම සඳහා භාවිතා කරන මාධ්‍යයකි,
1. දිය සායම් 2. බයින්ඩර් ගම් 3. ජලය 4. පොල්තෙල්

12. පින්තාරු කිරීම සඳහා යොදා ගන්නා පින්සල් භාවිතයට පෙර විනාඩි 5-10 ක් පමණ ජලයේ පොඟවා ගැනීමේ අරමුණ වන්නේ,
1. සායම් උරා ගැනීම පහසු කිරීම සඳහා 2. සායම් දියකර ගැනීමේ පහසුව සඳහා
3. සායම් වියළා ගැනීමේ පහසුව සඳහා 4. සායම් හොඳින් හැසිරවීමේ පහසුව සඳහා

13. එකම දේ නැවත නැවත ප්‍රතිනිර්මාණය කිරීමේ හැකියාව ඇති, පෝස්ටර්, ආරාධනා පත්‍ර සැකසීම් සඳහා වර්තමානයේ දී භාවිතයට ගනු ලබන සායම් ආලේපන ක්‍රමයක් වන්නේ,
1. අච්චු මුද්‍රණය 2. සිදුරු තහඩු මුද්‍රණය
3. තාප බන්ධිත ක්‍රමය 4. තිර රාමු මුද්‍රණය

14. වර්ණ ගැන්වීමේ ක්‍රියාවලියේ දී බතික් නිර්මාණ සඳහා භාවිත කරනු ලබන වර්ණක වන්නේ,
1. අම්ල, සල්ෆර් සහ සරල සායම් 2. සල්ෆර්, ඇසොයික් සහ අපකිරණ සායම්
3. නෙප්තෝල්, වැට් සහ ප්‍රෝෂියන් සායම් 4. ක්‍රෝම්, මොඩන්ට් සහ අපකිරණ සායම්

15. රෙදි පිළි අලංකරණයේ දී පෙර පිරියම් කිරීම සඳහා කෝස්ටික් සෝඩා රසායනික මිශ්‍රණය භාවිතා කරමින් සිදුකැනු ලබන පෙර පිරියම් ක්‍රමය
1. කැඳහරණය 2. මලහරණ 3. කාබනීකරණය 4. විරංජනය

16. සායම් පෙවීම කළ රෙදි සඳහා සිදු කරනු ලබන පසු පිරියම් ක්‍රමයක් ලෙස සැලකෙනුයේ,
1. වියළි හුමාලය තුළින් ගමන් කරවීම. 2. හුමාලකරණය
3. පවනේ වියළීම 4. තද උෂ්ණත්වයකින් මැදීම

17. කෙඳි හඳුනා ගැනීම සඳහා සිදු කරනු ලබන පිළිස්සුම් පරීක්‍ෂාව සිදු කිරීමේ දී පිහාටු පිළිස්සෙන ගඳ වහනය වන කෙඳි වර්ගය වන්නේ,
1. ලෝම කෙඳි 2 ලිනන් කෙඳි 3. කපු කෙඳි 4. ඛනිජ කෙඳි

18. සරල පින්තාරු ක්‍රමයක් වන නූල් මඟින් මුද්‍රා තැබීමේ පියවර පහත දක්වේ.
A - රෙදි මුද්‍රණ සායම් පැතලි බඳුනකට දමා ගැනීම.
B - නූල් කොටස් ඇඟිලි තුඩු ආධාරයෙන් සායම් බඳුනේ විසුරුවා හැරීම.
C - රෙදි කැබැල්ල මුද්‍රණතලයේ රැලි නොවැටෙන සේ අතුරා ඩ්‍රෝවින් ඇණ ගැසීම.
D- වර්ණ සහිත නූල් මුද්‍රණ .තලයේ රටා ලැබෙන සේ යෙදීම.
E- මඳ පවනේ වියළීම

1. A,B,C,D, සහ E 2. B,A,D,C සහ E
3.C,A,B,D සහ E 4. C,B,A,D සහ E

19. තාප බන්ධිත කඩදාසි මාධ්‍යයෙන් රෙදි පිළි අලංකරණය සිදුකිරීමේ දී නිර්මාණකරුවාට ලැබෙන ප්‍රධාන වාසිය වන්නේ,
1. ඇඳීමේ හැකියාව නැති වුවද අලංකාර නිර්මාණ කළ හැකි වීම.
2. ඉතා ඉක්මනින් නිර්මාණයක් අවසන් කිරීමට හැකිවීම.
3. උපකරණ හා මෙවලම් භාවිතයෙන් තොරව නිර්මාණ සිදු කිරීමට හැකි වීම.
4. ගෘහ අලංකරණ ක්‍රම සඳහා භාවිත කළහැකි වීම.

20. රෙදිපිළි නිෂ්පාදනය සඳහා යොදා ගැනෙන තාපයට ඔරොත්තු දෙන ගිනි නොගැනීම වැනි ගුණාංග... යුක්ත කෙඳි වර්ගය වනුයේ,
1. සේද කෙඳි 2. ඛනිජ කෙඳි 3. වීදුරු කෙඳි 4. ලෝම කෙඳි



21. මෙම රූප සටහනේ දැක්වෙන වියමන් රටාව වන්නේ,
1. තුඩු හීරි වියමන් රටාව 2. රැව්තහීරි වියමන් රටාව
3. දඟරහීරි වියමන් රටාව 4. කඩහීරි වියමන් රටාව

22. පහත දැක්වෙනුයේ එකිනෙකට වෙනස් සරල වියමන් රටා හතරකි. එම වියමන් රටා අතරින් දික් හීරි වියමන් රටාව තෝ...


1

2

3

4

23. විවීමේ දී රටාවට අනුව නූල් ඇද ගැනීම සඳහා ආධාර කරගනු ලබන උපකරණය දැක්වෙන රූපසටහන වන්නේ,



1 2 3 4

24. ක්‍රි.ව. 1773 දී ජෝන් කේ විසින් පේෂ කර්මාන්තය තුළ නිපදවූ නිෂ්පාදන වේගය වැඩිම රෙදි විවීමේ යන්ත්‍රය වනුයේ,
1. යුටිලිටි යන්ත්‍රය 2. බලවේග යන්ත්‍රය 3. ජවනඩා යන්ත්‍රය 4. චාම් යන්ත්‍රය

25. විවීම් තාක්ෂණයේ දී නූල් හැදයට හරස් නූල් යෙදීම සඳහා නූල් විවර සැකසීම සඳහා සීරු දමා ගැනීම සිදු කරන්නේ,
1. නූල් බෙරයේ ආධාරයෙනි. 2. නූල් බෙත්ම ආධාරයෙනි.
3. නූල් කුරු රාක්කයේ ආධාරයෙනි. 4. එතුම් රෝදයේ ආධාරයෙනි.

26. නූල් කිලෝ ග්‍රෑම් 5 ක් බර නූල් මිටියක නූල් කැරලි 100 ක් තිබුණි. එය දෙපට නූලක් නම් එම නූලේ අංකය වන්නේ,
1. $40^{s}$ 2. $80/2^{s}$ 3. $40/2^{s}$ 4. $80^{s}$

27. අංක $2/80^{s}$ වන නූල් කිලෝ ග්‍රෑම් 03 ක ඇති නූල් කැරලි සංඛ්‍යාව වන්නේ,
1. 120 2. 240 3. 160 4. 320

28. සෙන්ටිමීටර එකකට නූල් 30 බැගින් යොදා නොම්මර $2/20^{s}$ දික් නූල් භාවිත කර 60m ක් දිග නූල් හාදයක් සකස් කර ඇත. එහි පළල 40cm ක් නම් හැදයට අවශ්‍ය නූල් පොටවල් සංඛ්‍යාව වන්නේ,
1. $30 \times 60 = 1800$ 2. $40 \times 40 = 1600$ 3. $30 \times 40 = 1200$ 4. $60 \times 40 = 2400$

29. මෙට්‍රික් අංක $15^{s}$ ක් වූ නූල් මිටියක බර කිලෝ ග්‍රෑම් 4 කි. එම නූල් මිටියේ අඩංගු නූල් කැරලි ගණන වන්නේ,
1. කැරලි 60 කි. 2. කැරලි 80 කි. 3. කැරලි 120 කි. 4. කැරලි 160 කි.

30. මුළුතැන්ගෙයි පරිහරණය කෙරෙන වළං වැනි රතු මැටි භාණ්ඩ නිපදවීම සඳහා භාවිත කරන මැටි විශේෂය වන්නේ,
1. කෙඔලින් මැටි 2. පිහිටි මැටි 3. අගම් මැටි 4. වාත්තු දියර

31. සකපෝරුවේ භාණ්ඩ ඉදිකිරීමේ දී මැටි පිඩෙහි වයනය ලබාගත් පසු ඊළඟ පියවර වනුයේ,
1. බඳුනේ බිත්ති එසවීමය. 2. බඳුනේ කට හැඩගැන්වීම.
3. මැටි පිඩ විවෘත කිරීම. 4. බඳුනේ පතුළ සකස් කිරීම.

32. රසායනික ජල අනු දෙකක් අඩංගුව ඇති කෙඔලනයිට් මැටි විශේෂය ඊට අමතරව එකතු වී ඇති යකඩ ප්‍රතිශතය මත නැවත වර්ග දෙකකට වෙන් කෙරේ. ඒවා නම්,
1. අගම් මැටි, පිහිටි මැටි 2. මකුළු- මැටි, තලප මැටි
3. කෙඔලින් මැටි, බෝල මැටි 4. රතු මැටි, කළු මැටි

33. මැටි පසෙහි ජලය උරා ගැනීමේ හැකියාව ලැබෙන සේ පවතින සිදුරු සහිත බව හඳුන්වන නාමය වන්නේ,
1. සුවිකාර්යතාවය යි. 2. සවිවරතාවය 3. භංගුරතාවය 4. හැකිළීම

34. පහත දක්වා ඇති මැටි භාණ්ඩ අතරින් සකපෝරුව භාවිතයෙන් නිපදවා ගත හැකි මැටි භාණ්ඩ වන්නේ,


1


2


3


4

1. B 2. C හා D 3. B හා D 4. A B හා D

35. මැටි භාණ්ඩ පිළිස්සීමේ දී මූලික පිළිස්සීමකට පමණක් ලක් නොකරන භාණ්ඩ වන්නේ,
1. ගුරුලේත්තු 2. විසිතුරු මල් බඳුන්
3. කාසිකැට 4. පෝසිලේන් භාණ්ඩ

36. මැටි භාණ්ඩ පිළිස්සීම සඳහා භාවිතා වන පිළිස්සුම් කලාප කිහිපයකින් යුක්ත පෝරණු වර්ගය වනුයේ,
1. උඩු දහර පෝරණු 2. සංතතික උමං උඳුන්
3. සංතතික උඳුන් 4. පැති දහර පෝරණු

37. පහත දක්වා ඇති මැටි භාණ්ඩ අතරින් සංකීර්ණ අච්චු ක්‍රමය භාවිතා කරමින් නිර්මාණය කරන ලද මැටි භාණ්ඩය වනුයේ,









1 2 3 4

38. මැටි භාණ්ඩ අලංකාර කිරීමේ දී කඩදාසි උපයෝගී කර ගනිමින් සිදු කරන නිර්මාණ හඳුන්වන්නේ,
1. කොලාජ් හා මාබල් නිර්මාණ යනුවෙනි. 2. කොලාජ් හා ඩෙකොපාජ් යනුවෙනි.
3. ඩෙකොපාජ් හා මාබල් නිර්මාණ යනුවෙනි. 4. මාබල් හා පල්ප් නිර්මාණ යනුවෙනි.

39. සෙරමික් කර්මාන්තයේ දී ඔප මිශ්‍රණ යොදා ඔබ ගැන්වීමේ දී පිළිස්සුණු පෘෂ්ඨය මත ඇති සියුම් සිදුරු පැවතීමේ දෝෂය හඳුන්වන්නේ,
1. ස්පෙකින් 2. ක්‍රේසින් 3. පින්හෝල් 4. පීලන්

40. උද්‍යාන අලංකරණ නිර්මාණය කිරීමේ දී පල්ප හා ප්ලාස්ටර් ඔෆ් පැරිස් මූර්ති මත ක්ලියර් වාර්නිෂ් ආලේප කිරීමෙන් අපේක්ෂා කරනුයේ,
1. දීප්තිමත් පෙනුමක් ලබාගැනීම. 2. කල්පැවැත්ම ආරක්ෂා කිරීම.
3. ශක්තිමත් බව පවත්වා ගැනීම. 4. වර්ණ තීව්‍ර කර ගැනීම.

## ශිල්ප කලා - II

**පළමු වැනි ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(01) "නව නිපැයුම් තුළින් ලොව ජය ගනිමු" යන තේමාව යටතේ වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත. එමඟින් නිර්මාණ කුසලතාවයන් සතු පාසල් දරුවන්ට වැඩි අවස්ථාවක් ලබාදීමට අපේක්ෂා කරනු ලබයි.

i. මෙම වෙළඳ ප්‍රදර්ශනය පිළිබඳ පාසැල් සිසුන් දැනුවත් කිරීමට පෝස්ටරයක් නිර්මාණය කරන්න.
ii. එම වෙළඳ ප්‍රදර්ශනය විවෘත කිරීම සඳහා පැමිණෙන ආරාධිතයන් පිළිගැනීම සඳහා අයි ඩ්‍රොප් (කඳුළු බිංදු) හැඩයේ මල් කළඹක දළ රූප සටහනක් ඇද දකින්න.
iii. වෙළඳ ප්‍රදර්ශනයේ පිවිසුම් දොරටුව අලංකාර කර ගැනීමට යොදා ගත හැකි ස්වභාවික අමු ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
iv. වෙළඳ ප්‍රදර්ශනය සඳහා නිර්මාණ ඉදිරිපත් කරන සිසුන් හඳුනා ගැනීම සඳහා සිසුන්ට පැළඳීමට සුදුසු ලාංඡනයක් සැලසුම් කරන්න.
v. මෙම වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශිල්ප කලා විෂය හදාරන සිසුන්ට නිර්මාණ ඉදිරිපත් කළ හැකි ක්ෂේත්‍ර 4 ක් ලියන්න.
vi. මෙම වෙළඳ ප්‍රදර්ශනයේ පිළිගැනීමේ නර්තන කණ්ඩායමට පැළඳීම සඳහා සුදුසු ආභරණ සඳහා ස්වභාවික අමුද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
vii. වෙළඳ ප්‍රදර්ශනය සඳහා නිර්මාණ ඉදිරිපත් කරන සියලු සිසුන් සඳහා ත්‍යාග පාර්සලයක් පිරිනැමීමට නියමිතය. ඒ සඳහා සුදුසු ඇසුරුමක රූපීය පෙනුම ඇඳ දක්වන්න.
viii. වෙළඳ ප්‍රදර්ශනයේ ජයග්‍රාහකයින් සඳහා පිරිනැමීමට සුදුසු ජය සංකේතයක ආකෘතියක් ඇඳ දක්වන්න.
ix. වෙළඳ ප්‍රදර්ශනයේ සියලු වෙළඳ ප්‍රදර්ශන කුටි සඳහා පසුබිම නිර්මාණය කරන ලද්දේ වියමන් රටා ආශ්‍රයෙනි. පසුබිම නිර්මාණය කිරීමට ජටා වියමන ආශ්‍රිතව නිර්මාණයක් ඇඳ දක්වන්න.
ix. ප්‍රදර්ශනය සඳහා පැමිණෙන ආරාධිතයන්ගේ දිවා ආහාර ඇසුරුම සකසන ලද්දේ සව්ධි ෂඩාස්‍ර ඇසුරුමක් ආශ්‍රයෙනි. සව්ධි ෂඩාස්‍ර ඇසුරුමෙහි විකසනය ඇඳ දක්වන්න.

(02) කාන්තාවන් භාවිතයට ගනු ලබන අත් බෑගයක ඉදිරි පෙනුම පහත දක්වේ.



i. දිග සෙන්ටිමීටර් 4 ක් ද පළල සෙන්ටිමීටර් 2 ක් ද වශයෙන් මිනුම් ගෙන ඉහත අත්බෑගයේ විකසනය ඇඳ දක්වන්න.

ii. වර්තමානයේ කාන්තා අත් බෑග් නිර්මාණය සඳහා භාවිතවන ස්වභාවික අමුද්‍රව්‍ය 2 ක් සහ කෘතීම අමුද්‍රව්‍ය 2 ක් නම් කරන්න.

iii. ඉහත සඳහන් අත් බෑගය පබළු මඟින් අලංකාර කර ගන්නා ආකාරය රූප සටහන් මඟින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(03) වර්තමාන ලෝකයේ රෙදි පිළි අලංකරණය සඳහා විවිධ නවීන ක්‍රම ශිල්ප උපයෝගී කරගනී.

i. තිර රාමු මුද්‍රණය සඳහා භාවිතයට ගනු ලබන උපකරණ ලියා දක්වන්න.

ii. සිදුරු තහඩුපත් මුද්‍රණය සඳහා භාවිත වන සායම් ආලේපන ක්‍රම තුනක් නම් කරන්න.

iii. ලූප් මැස්ම උපයෝගී කර ගනිමින් රිබන් ආශ්‍රිත බිත්ති සැරසිල්ලක් සඳහා සුදුසු මල් මෝස්තරයක් ඇඳ දක්වන්න.

(04) පාසැල් නිල ඇඳුමේ කලිසම් රෙදි සඳහා සකස් කරන ලද නූල් හැදයක තොරතුරු පහත දැක්වේ.

- ◆ හැදයේ දිග - 100 m
- ◆ හැදයේ පළල - 20 cm
- ◆ සෙන්ටිමීටරයක දික් නූල් ප්‍රමාණය - 40
- ◆ නූල් නොම්මරය - $2/40^{S}$
- ◆ නූල් වර්ණය - නිල්

i. කලිසම් රෙදි වියා ගැනීමට සුදුසු වියමන් රටා දෙකක් නම් කරන්න.

ii. නම් කරන ලද වියමන් රටා අතුරෙන් එක් වියමන් රටාවක නූල් මතුවීම ප්‍රස්තාර ගත කරන්න.

iii. හෘදයට අවශ්‍ය $2/40^{S}$ නිල් නූල් ප්‍රමාණය ගණනය කරන්න.

(05) ඇඳුම් මැසීමේ දී ඉතිරිවන රෙදි කැබලි විවිධ හැඩයන්ට කපා වර්ණ එකිනෙකට ගලපමින් අලංකාර නිර්මාණ බිහි කළ හැක.

i. ඉතිරිවන රෙදි කැබලි ආශ්‍රයෙන් නිර්මාණ කළ හැකි ගෘහ උපාංග හතරක් නම් කරන්න.

ii. රෙදි කැබලි ආශ්‍රයෙන් නිර්මාණය වන සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

iii. පැච්වර්ක් ක්‍රමය උපයෝගී කර ගනිමින් කුෂන් කවරයක් නිර්මාණය කරන ආකාරය රූප සටහන් මඟින් පැහැදිලි කරන්න.

(06) මැටි භාණ්ඩ නිර්මාණය කිරීමේ දී එම මැටි භාණ්ඩ භාවිතයට සුදුසු තත්වයට පත්කර ගැනීම සඳහා පිළිස්සීම සිදුකළ යුතුවේ.

i. මැටි භාණ්ඩ පිළිස්සීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රම දෙකක් නම් කරන්න.

ii. මැටි භාණ්ඩ පිළිස්සීමට ලක් කිරීම තුළින් මැටි භාණ්ඩ වල ඇතිවන වෙනස්කම් හතරක් ලියන්න.

iii. මැටි භාණ්ඩ පිළිස්සීමෙන් පසු සිදුකරන සායම් ආලේපන ක්‍රමයක් සඳහන් කර එමඟින් මැටි මල් බඳුනක් අලංකාර කර ගන්නා ආකාරය රූප සටහන් උපයෝගී කර ගනිමින් විස්තර කරන්න.

(07) තමන් අවට පරිසරය අලංකාරවත්ව පවත්වා ගැනීමට වර්තමානයේ විවිධ උපාංග උපයෝගී කරගනී.

i. උද්‍යාන විද්‍යා මූලධර්ම දෙකක් නම් කරන්න.

ii. මූර්ති ගොඩනැගීමේ දී භාවිත කරන ශිල්ප ක්‍රම දෙකක් නම් කර එයින් එක් ශිල්ප ක්‍රමයක් පිළිබඳව උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

iii. පල්ප මාධ්‍යයෙන් සත්ත්ව රූපයක් නිර්මාණය කර ගන්නා ආකාරය අනුපිළිවෙලින් ලියා දක්වන්න.

# තෙවන වාර පරීක්ෂණය - 2019

## ශිල්ප කලා

11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 2 | 11 - 3 | 21 - 4 | 31 - 3 |
| 02 - 1 | 12 - 4 | 22 - 1 | 32 - 3 |
| 03 - 4 | 13 - 4 | 23 - 1 | 33 - 2 |
| 04 - 2 | 14 - 3 | 24 - 3 | 34 - 3 |
| 05 - 3 | 15 - 2 | 25 - 2 | 35 - 4 |
| 06 - 3 | 16 - 1 | 26 - 3 | 36 - 2 |
| 07 - 4 | 17 - 1 | 27 - 1 | 37 - 1 |
| 08 - 1 | 18 - 3 | 28 - 3 | 38 - 2 |
| 09 - 2 | 19 - 1 | 29 - 1 | 39 - 3 |
| 10 - 2 | 20 - 2 | 30 - 3 | 40 - 1 (ල. 1x40) |

## II කොටස

(01) i. පෝස්ටරයක අඩංගු කරුණු ඇතුළත්ව නිර්මාණශීලීව පෝස්ටරය නිර්මාණ කිරීම. (ල. 02)
ii. කඳුළු බිංදු හැඩයට ලකුණු ලබාදීම. (ල. 02)
iii. ස්වභාවික ද්‍රව්‍ය පමණක් නම් කිරීම. (ල. 02)
iv. ලාංඡනය නිර්මාණශීලීව මාතෘකාවට අදාළව නිර්මාණය කිරීම. (ල.02)
v. ජනකලා ආශ්‍රිත කර්මාන්ත නම් කිරීම. (ල. 02)
vi. ස්වභාවික ද්‍රව්‍ය ආශ්‍රිත පබළු නම් කිරීම. (ල. 02)
vii. රූපීය පෙනුම ඇත්නම් ලකුණු ලබාදීම. (ල. 02)
viii. නිර්මාණශීලී බව අනුව ලකුණු ලබාදීම. (ල. 02)
ix. ජටා වියමන ආශ්‍රිතව නිර්මාණයක් ඇඳ දැක්වීම. (ල. 02) x.



(පාද සමාන විය යුතුය)
(ල. 02)

(02) i.



(ල. 04)

ii.පන්, පූට් පත්‍ර, සීසල් පත්‍ර ආදී ස්වභාවික ද්‍රව්‍ය
ප්ලාස්ටික් මිශ්‍ර, රබර් මිශ්‍ර ආදී කෘතිම ද්‍රව්‍ය(ල. 02)
iii.රූප සටහන් ඇඳීමට(ල. 02)
විස්තර කිරීමට(ල. 02)

(03)i.ස්ක්‍රීජය, මුද්‍රණ තලය, තිර රාමුව (ල. 03)
ii.පිටු අංක 66 (10 ශ්‍රේණිය පෙළ පොත) (ල. 03)
iii.මෝස්තරය ඇඳීම(ල. 02)
විස්තර කිරීම(ල.02)

(04)i.චාම් වියමන් රටාව / දික්දාර වියමන් රටාව (ල. 02)
ii.පිටු අංක 94/95 (10 ශ්‍රේණිය) (ල. 04)
iii.(ල. 04)

$$\frac{100 \text{ m x } 20 \text{ cm x } 40\text{x}2}{1000\text{x } 40} = 4 \text{ kg } //$$

(05) i. බඳුන් පලස්, කුෂන් කවර, පාපිස්නා, සෙල්ලම් සතුන් (ල.02)
ii. පිටු අංක 159 (10 ශ්‍රේණිය) (ල. 04)
iii. රූප සටහන් ඇඳීම (ල. 02)
විස්තර කිරීම. (ල. 02)

(06) i. පළමු පිළිස්සීම / ද්විතීයික පිළිස්සීම (ල. 02)
ii. පිටු අංක 116 (11 ශ්‍රේණිය ) (ල. 04)
iii. පින්සල් මගින්/ ඉරටු මගින් / ස්පොන්ච් මගින්/ සායම් වක් කිරීම / සායම් ගිල්ලවීම
මින් එක් ක්‍රමයක් විස්තර කිරීම (ල. 02)
රූප සටහන් ඇඳීම (ල. 02)

(07) i. අවකාශය/ සම්පින්ඩනය/ අනුපාතය/ විවිධත්වය/ තෝරා ගත් ස්ථානය/ සමබරතාවය/ කැපී පෙනෙන සුළු බව/ නිමාව (ල.02)
ii. පූර්ණ උන්නත / අර්ධ උන්නත / අල්ප උන්නත (ල. 02) iii. පිටු අංක 179 - විස්තර කිරීම(ල. 04)